# හදරිදවන මතක සුවඳ 2



රෝහිත මුණසිංහ - ප්‍රංශයේ සිට

*ඉන් එක සහෝදරයෙකුගෙ අම්මා කෙනෙක් දවසක් මම දැකලා ඔළුවෙ අත්දෙක ගහගෙන මහෙම කිව්වා. "උඹ මගේ කොල්ලා විප්ලව කරන්න අරන් ගියා. ඌ නිරපරාදේ මැරුණා. උඹ යහතින් ඉන්නවා. උඹට හෙණ ගහන්න ඕනා." ඒ වගේ මැරුණ වෙනත් සහෝදරවරුන්ගේ අම්මලා මගේ මූණට එහෙම නොකිව්වත් එහෙම හිතන්නැති. මේ සහෝදරවරුන්ටත් ඒ වගේ දේවල් සිද්ධ වෙන්න පුළුවන්. මේක ජීවිතයත් මරණයත් අතර සටහනක්.*

නීත්‍යානුකූල තත්වයක් යටතේ කළ හැකි සියලුම දේශපාලන ක්‍රියාකාරකම්වලට තහංචි පනවා පක්ෂයක් අසාධාරණ ලෙස තහනම් කොට ඔවුන් රහසිගත දේශපාලනයට තල්ලු කර දැමූවිට නීත්‍යානුකූල නොවන ආකාරයට කටයුතු කිරීමට සිදුවීම අරුමයක් නොවේ. ධර්මෙ සහෝදරයා අභීත විප්ලවවාදියෙකු වුව පක්ෂය විසින් එවැනි කාර්යයකට ඔහු වැනි සහෝදරයෙකු යොදවා නොගත යුතුව තිබුණි.

ධර්මෙ සහෝදරයා තමා කරන්නට ගිය කාරිය සාර්ථක කරගත් නමුදු මෝටර් සයිකලය පණ නංවාගත නොහැකි වූයෙන් පලායාමට නොහැකි විය. ප්‍රදේශවාසීන් විසින් වටකර අල්ලා පහර දී පොලිසියට භාරදෙන ලදුව එහිදී ද දරුණු පහරදීම්වලට ලක් වූ ඔහු රෝහලකට ඇතුලත් කිරීමෙන් පසු මිය ගියේය. පවුලේ ඥාතීන් වෙත මිනිය භාර දුන්නද අවමගුල් කටයුතු සිදු කිරීමට ලබාදෙන ලද්දේ පැය හතක කාලයක් පමණි.

ඔහුට අවසන් ගෞරව දැක්වීමට යාමට මට උවමනා වුවද තාත්තා (පක්ෂයේ තාත්තා) මා වැළැක්වීය. "පුතා යන එක සුදුසු නෑ. ගමේ අය ඇර මරණෙට පිටින් එන්නේ කව්ද කියලා පොලිසිය බලාගෙන ඉඳීවි. මම ගිහිල්ල ඇවිල්ල විස්තර කියන්නම්. මම නාකි මිනිහනේ." තාත්තා පැවසී ය.

ධර්මිෂ්ඨ වෙස් මුහුණක් දමාගත් ජේ. ආර්. ගේ අධර්මිෂ්ඨ රජය ජ.වි.පෙ. මර්ධනය කිරීමට කැස කවද්දී පක්ෂයේ දේශපාලය නව මඟකට ප්‍රවිශ්ට වන පෙර නිමිති පහළවෙමින් තිබුණේ ධර්මෙගේ මරණයටත් බොහෝ කලින්ය. ආසන කමිටු සාමාජිකයන් වූ අප කැඳවූ දිස්ත්‍රික් ලේකකම් මුණසිංහ සහෝදරයා විශේෂ දේශනයක් පැවැත්වී ය.

"අද මේ සහෝදරවරු වෙනත් අයට කොකු ගහලා පක්ෂයට බන්දවා ගන්නවා වගේ 71ට කලින් අපිත් ඒ දෙයම කළා. අරගලයෙන් පස්සේ අහම්බෙන් වගේ මම ඉතුරු උනත් මම විහින් පක්ෂයට බන්දවා ගත්ත සමහර සහෝදරවරු මැරුණා. ඉන් එක සහෝදරයෙකුගෙ අම්මා කෙනෙක් දවසක් මම දැකලා ඔළුවෙ අත්දෙක ගහගෙන මහෙම කිව්වා. "උඹ මගේ කොල්ලා විප්ලව කරන්න අරන් ගියා. ඌ නිරපරාදේ මැරුණා. උඹ යහතින් ඉන්නවා. උඹට හෙණ ගහන්න ඕනා." ඒ වගේ මැරුණ වෙනත් සහෝදරවරුන්ගේ අම්මලා මගේ මූණට එහෙම නොකිව්වත් එහෙම හිතන්නැති. මේ සහෝදරවරුන්ටත් ඒ වගේ දේවල් සිද්ධ වෙන්න පුළුවන්. මේක ජීවිතයත් මරණයත් අතර සටහනක්. මේ සහෝදරවරුන්ගේ කාගෙ හරි හිතේ දෙගිඩියාවක් තියෙනවා නම් අද උනත් පක්ෂයෙන් අයින් වෙලා යන්න. අපි තරහා නෑ.

අවංකවත්, ඍජුවත් අපහට එසේ පැවසූ මුණසිංහ සහෝදරයා 1988 මැද භාගයේදී දිනකදී 'ප්‍රා' සංවිධානයේ මිනීමරුවන් අතින් රත්මලානේදී ඝාතනයට ලක් විය. මියයන විට ඔහු දරුවන් දෙදෙනෙකු හෝ තිදෙනෙකුගේ පියෙකි. මුණසිංහ සහෝදරයා විවාහ වූයේ බුද්ධි අක්කා සමඟය. ඇය පක්ෂයේ වැඩ කටයුතුවලට සහභාගි වූයේ පළමු දරුවා ලැබෙන තුරු පමණි. ඉන් පසුව ඇය ක්‍රියාකාරී දේශපාලනයේ යෙදෙනු අප දුටුවේ නැත.

ඝාතනයට ලක්වන තුරුම තමා ඇදහූ දේශපාලනයේ ජයග්‍රහණය වෙනුවෙන් ඇපකැප වූ අව්‍යාජ විප්ලවවාදියෙකු වූ මුණසිංහ සහෝදරයා 'ප්‍රා' නමින් ක්‍රියාත්මක වූ මිනීමරුවන්ට පෙන්වා දුන්නේ ඉන් වසර කිහිපයකට පෙර ඔහු සමඟ එකම දේශපාලන අරමුණක් වෙනුවෙන් ක්‍රියාත්මක වූ ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලයේ සිට වාස් තිලකරත්න හා බස්නාහිර පළාතේ දිස්ත්‍රික් ලේකම්වරයෙකුව සිටි 'විල්ෆ්‍රඩ් රංජිත් පීරිස්' විසින් යයි පැවසේ. සී. විජයලත් යන ආරූඪ නමකින් පොත් දෙක තුනක් ද ලියා පළකර ඇති රංජිත් පීරිස්ගෙ මෙතෙක් ලඝු නොකළ පොතක ටයිප් පිටපතක් මට කියවන්නට ලැබිණ. තමාත්, වාස් තිලකරතනත් රජයේ හමුදා සමඟ එක්වී ජ.වි.පෙ. පැරණි නායකයන් දඩයම් කළ බව ඔහු එම කෘතියෙන් පිළිගනී. ඔහු එය පවසන්නේ මෙසේය. "මම දඩ බල්ලෙකු බවට පරිවර්තනය වීමි. මගේ බලු ඉව යොදා ගොදුරු අල්ලා දුනිමි."

"මෙන්න ඔබගේ නායකයා කසාද බැඳලා"

මහ මගදි මට හමු වූ මා හඳුනන ඉංග්‍රීසි ගුරුවරයෙක් ඔහු අත වූ 'ඩේලි නිව්ස්' ඉංග්‍රීසි පත්‍රය මා අත තැබීය. එහි මුල් පිටුවේ ම වම්පස තීරුවක පළ වී තිබුණෙ රෝහණ විජේවීර සහෝදරයා විවාහ වූ පුවතේ කෙටි විස්තරයකි. මට ඇති වූ වේදනාත්මක විමතිය විවාහ වූ පුවතේ කෙටි විස්තරයකි. මට ඇති වූ වේදනාත්මක විමතිය රජයේ පුවත් පතකින් එය දැන ගන්නා තුරු මා එය නොදැන සිටීම ය. නැතහොත් රෝහණ සහෝදරයා විවාහවීම සතුටුවිය යුතු මංගල කාරණයකි. මා එවිට ආසන කමිටුවේ පූර්ණ කාලීන සාමාජිකයෙකු මිස ආසන සංවිධායක නොවේ. නගරයේ සමුද්‍ර මාවතට ආසන්නයේම වූ පක්ෂ කාර්යාලයට ගිය මා වැලිගම ආසන සංවිධායක සොයුරා වූ නෙත්තිකුමාරට ආරංචිය පැවසීමි. නෙත්තිගේ මුහුණ දුක්මුසු කනස්සලු බවකට හැරිණ.

ලොක්කා බැන්ද එතනම් හොඳයි මහත්තයෝ. ඒත් කමිටු හරහා අපිටත් දන්වලා වැඩේ කරානම් තමයි වටින්නේ." නෙත්ති පැවසුවේ එසේ ය.

සැබවින්ම පක්ෂට එසේ කළහැකිව තිබිණ. රෝහණ විජේවීර යනු පක්ෂයේ සැවොම මුළු හදින් ආදරය කළ අපගේ ලොකු අයියා ය.

විවධ අයුරින් බලපෑම් කිරීමට සමත් වූ කාන්තා චරිතයෝ බොහෝ වෙත්. එහෙත් රෝහණ විජේවීර සොයුරාණන්ගේ බිරිඳ වූ චිත්‍රාංගනී ප්‍රනාන්දු නම් වූ එම සොයුරිය ජ.වි.පෙ. නායකයාගේ බිරිඳ මිස ජනතා විමුක්ති පෙරමුණේ ගමන් මගට කිසිම අයුරකින් අවතීර්ණ නොවූ පක්ෂයට මොනම අයුරකින් හෝ බලපෑම් නොකල තැනැත්තියකි.

අව්‍යාජ විප්ලවවාදියෙකු වූ මේ ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයා කුරිරු ලෙස ඝාතනයට ලක් වූ පසු මේ සොයුරියගේ ඒකායන බලාපොරොත්තුව වූයේ එම උසස් මිනිසාගේ ලෙයින් දාව තමාට තිළිණ කළ දරු කැලත හදා වඩා ගැනීම තම ජීවිතයේ වගකීම සේ ය. ජීවිතාරක්ෂාව පතා විදේශගත වූ සහෝදරවරු ඒ ඒ රටවල ජ.වි.පෙ. ශාකා සමිති පිහිටුවා ගත්තෝ ය. ඉන් පෙර පක්ෂයට තිබුණේ මහා බ්‍රිතාන්‍යයේ ලන්ඩන් ශාඛාව පමණකි. මෙසේ පිහිටුවා ගන්නා ලද පක්ෂයේ විදේශීය ශාඛාවල එක් අරමුණක් වූයේ රෝහණ විජේවීර හා උපතිස්ස ගමනායක සහෝදරයාගේ බිරියන් හා දරුවන් විදේශ රටකට ගෙන්වාගෙන ඔවුන් රැකබලා ගැනීම හෝ ඔවුන් ලංකාවේම සිටින්නේ නම් උදව් උපකාර කිරීමත් ය. සැබැවින් ම ඒ සඳහා වැඩ පිළිවෙල ද, සැළසුම් ද සැකසිණ. ඒත් යම් යම් සිදුවීම් හා අර්බුද හේතුවෙන් ඒ සියල්ල අකර්මන්‍ය විය. එයට මූලික වූ එක හේතුවක් වූයේ විජේවීර සහෝදරයාගේ මස්සිනා වූ දොස්තර චන්ද්‍ර ප්‍රනාන්දු සිය නැගෙණිය හා ඇගේ දරුවන් ලන්ඩනයට ගෙන්වා ගෙන ඔහුගේ රැකවරණය යටතේ තබා ගැනීමටත්, ජ.වි.පෙ. නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ නියමුවා වීමටත් උත්සහ කරමින් ලොකු කලබග ඇනියක් හා ඝෝෂාවක් කිරීමත් ය.

මේ දේශපාලන අවුල් වියොවුල්වලට මැදි වී තමාගේත් දරුවන්ගේත් ජීවිත අවුල් ජාලයක් කර ගැනීමටත්, දේශපාලන ඉත්තන් වීමටත් වඩා රජයේ වගකීම යටතේ ත්‍රිකුණාමලයේ නාවික හමුදාව භාරයේ තවදුරටත් ජීවත්වීම මැනවයි චිත්‍රාංගනී විජේවීර තීරණය කළා ය.

තම සහෝදරයා නොදැන සිටි ජ.වි.පෙ. යනු සැමියාගෙන් බිරිඳට හෝ පවුලේ සමාජිකයන්ට යන පක්ෂයක් නොවන බව විජේවීර සහෝදරිය දැන සිටි බවට කිසිදු සැකයක් නැත.

1971 අප්‍රේල් 05 වෙනිදා ආරම්භ වූ කැරැල්ල හෙවත් සන්නද්ධ නැගිටීම ගැන එක් එක් අයගේ දේශපාලන දෘෂ්ටි කොණයෙන් විවිධාකාර වූ විග්‍රහ ඇත. කෙසේ වුවද එය මෙතකැයි කියා කිව නොහැකි පාඩම් හා අත්දැකීම් රාශියක් ශ්‍රී ලංකා දේශපාලන වංශ කතාවට එකතු කළ ඓතිහාසික සංසිද්ධයකි.

රෝහණ විජේවීර සහෝදරයාම කියූ වචන දෙකකින් කියතොත් 'ලෙයින් හා යකඩින්' අරගලය මර්ධනය කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කෙරෙහි ජ.වි.පෙ. අනුගාමික සාමාජික සිත්හි තිබුණේ තදබල වෛරයකි. එම වෛරය බණ්ඩාරනායක මැතිනිය කෙරෙහිද නොඅඩුවම පැවතිණි. සිරගත වූ සොයුරෙකු විසින් පබඳින ලද මේ කව, එකල බොහෝ සොයුරන්ගේ මුවඟ රැඳුණේ රනිසා විය යුතු ය.

"මැතිවරණයෙදි දින රවටා ලද බලය
උපතින් ලද ද තී යෙදුවේ යුධ බලය
තරුණන් මැරූ සුදු අදියර සුරතලිය
මරණින් මතුව ගන්නෙමි ලේ වල පලිය"

(ලබන කලාපයට)